දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය - 2014 අප්‍රේල්
First Examination in Arts (External) - April 2014

# භුවිප්‍ර 1.3 - ප්‍රායෝගික භූගෝල විද්‍යාව
# GY 1.3 – Practical Geography

කාලය පැය හතර යි

**එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින්වත් තෝරා ගෙන ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**
**ගණක යන්ත්‍ර භාවිතයට අවසර ඇත.**

---

## I කොටස - භූ ලක්ෂණ සිතියම

(01) (i) සපයා ඇති 1:50,000 මෙට්‍රික් සිතියමේ ගිණිකොන දිග කාර්තුවේ $25km^2$ සමචතුරස්‍රාකාර ප්‍රදේශයක් තෝරා ගන්න. තෝරාගත් ප්‍රදේශය ආවරණය වන පරිදි 2cmx2cm කොටු දැලක් ඇසුරින් උතුරු දකුණු දිශානුගත සරල රේඛා 5 ක් ද, නැගෙනහිර බටහිර දිශානුගත සරල රේඛා 5 ක් ද, නිර්මාණය කොට මධ්‍ය ලක්ෂ්‍ය නියෝජනය වන පරිදි ක්‍රමානුකූල ලක්ෂ්‍ය නියැදි ක්‍රමය යටතේ ප්‍රදේශයේ භූමි පරිභෝගය ඇස්තමේන්තු කරන්න.

(ලකුණු 15)

(ii) ඇස්තමේන්තු කරන ලද භූමි පරිභෝග රටාව අනුව හෙළිවන දෑ මොනවාදැයි කෙටියෙන් දක්වන්න.

(ලකුණු 05)

(iii) වගා කටයුතු හා මාර්ග කටයුතු අතර සම්බන්ධතාව කෙබඳු ද යන්න කෙටියෙන් දක්වන්න.

(ලකුණු 05)

(02) (i) සිතියමක් විශාල කිරීම හා කුඩා කිරීම ඇසුරින් ලැබෙන වාසි හා අවාසි මොනවාදැයි දක්වන්න.

(ලකුණු 05)

(ii) මෙට්‍රික් සිතියමේ (1:50,000) මාතර නගරයේ සිට රුහුණ විශ්වවිද්‍යාලය දක්වා ඇති මාර්ගයේ දිග 7cm ක් වේ නම් එහි සැබෑ දුර කොපමණදැයි ගණනය කරන්න.

(ලකුණු 03)

(iii) 1:50,000 පරිමාණයට නිර්මාණය කරන ලද සිතියමක් 1:10,000 පරිමාණයට නිර්මාණය කළ විට නව සිතියමේ 1km ක් දැක්වීමට සෙන්ටිමීටර් කොපමණ ප්‍රමාණයක් අවශ්‍ය වේ ද යන්න දක්වන්න.

(ලකුණු 05)

(iv) පැතිකඩ නිර්මාණය තුළින් භෞතික පරිසරය විශ්ලේෂණයන්ට යොදා ගත හැකි අයුරු උදාහරණ ඇසුරින් දක්වන්න.

(ලකුණු 07)

(v) සපයා ඇති මහියංගණය 1:50,000 මෙට්‍රික් සිතියමේ දැක්වෙන හොරබොර වැවෙහි ක්ෂේත්‍රඵලය සෘජුකෝණි ක්‍රමය යටතේ ආගනිත කර දක්වන්න.

(ලකුණු 05)

## II කොටස - දත්ත ඉදිරිපත් කිරීම

(03) 2005 සිට 2011 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ ඩෙංගු රෝගීන්ගේ ව්‍යාප්තිය තෝරාගත් දිස්ත්‍රික් කිහිපයක් ඇසුරින් අංක 01 වගුවේ දැක්වේ. එම දත්ත ඇසුරින් පහත දැක්වෙන අභ්‍යාස කරන්න.

(i) සුදුසු ප්‍රස්තාරික ක්‍රමයක් යොදා ගෙන එම දත්ත නිරූපණය කරන්න.

(ලකුණු 20)

(ii) නිර්මාණය කරන ලද ප්‍රස්තාරයට අනුව එක් එක් දිස්ත්‍රික්කවල ඩෙංගු රෝගීන්ගේ ව්‍යාප්තිය පිළිබඳව හෙළිවන දෑ කවරේදැයි දක්වන්න.

(ලකුණු 05)

අංක 01 වගුව

ශ්‍රී ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්ක 05 ක ඩෙංගු රෝගීන්ගේ ව්‍යාප්තිය 2005 - 2011 දක්වා

| වර්ෂය | දිස්ත්‍රික්ක | | | | |
|---|---|---|---|---|---|
| | කොළඹ | ගම්පහ | ගාල්ල | මාතර | නුවරඑළිය |
| 2005 | 1985 | 1262 | 101 | 175 | 33 |
| 2006 | 3429 | 1775 | 268 | 537 | 45 |
| 2007 | 1866 | 995 | 103 | 236 | 42 |
| 2008 | 1600 | 108 | 106 | 394 | 30 |
| 2009 | 4810 | 4662 | 657 | 1159 | 298 |
| 2010 | 5942 | 3957 | 921 | 614 | 225 |
| 2011 | 10123 | 4374 | 735 | 795 | 252 |

මූලාශ්‍රය - වසංගත රෝගී අංශය, කොළඹ.

(04) (i) අංක 02 වගුවේ දැක්වෙන දත්ත නිරූපණය කිරීම සඳහා සුදුසු ප්‍රස්තාර වර්ගය කුමක්දැයි නම් කරන්න.

(ලකුණු 03)

(ii) එම දත්ත පදනම් කරගෙන ඉහත ප්‍රස්තාරය නිර්මාණය කරන ආකාරය හා එහි ගුණදොස් මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(iii) අංක 03 වගුවේ දක්වා ඇති දත්ත නිරූපණය සඳහා සුදුසු ප්‍රස්තාර වර්ගය කුමක්දැයි නම්කර එය කටු සටහන් මඟින් දක්වන්න.

(ලකුණු 07)

(iv) දත්ත පදනම් කරගෙන නිර්මාණය කරන ලද කටු සටහනේ වාසි හා අවාසි මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

අංක 02 වගුව

ගාල්ල දිස්ත්‍රික්කයේ මාසික සාමාන්‍ය වර්ෂාපතනය හා උෂ්ණත්වය 2010

| මාසය | වර්ෂාපතනය mm | උෂ්ණත්වය $C^0$ |
|---|---|---|
| ජනවාරි | 72 | 29.1 |
| පෙබරවාරි | 98.2 | 27.3 |
| මාර්තු | 81.3 | 28.4 |
| අප්‍රේල් | 293.7 | 28.4 |
| මැයි | 795 | 28.1 |
| ජූනි | 120.4 | 27.7 |
| ජූලි | 196.5 | 26.9 |
| අගෝස්තු | 319.5 | 27.0 |
| සැප්තැම්බර් | 228.8 | 26.9 |
| ඔක්තෝබර් | 656.7 | 27.3 |
| නොවැම්බර් | 270.7 | 26.8 |
| දෙසැම්බර් | 331.7 | 26.3 |

මූලාශ්‍රය : කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

අංක 03 වගුව

ස්ත්‍රී පුරුෂ හා වයස් කාණ්ඩ අනුව ජනගහණය ගාල්ල දිස්ත්‍රික්කය 2011

| වයස් කාණ්ඩය අවුරුදු | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|
| 0 - 4 | 45432 | 47957 |
| 5 - 9 | 47533 | 50175 |
| 10 - 14 | 50235 | 53027 |
| 15 - 19 | 50534 | 53343 |
| 20 - 24 | 44115 | 46569 |
| 25 - 29 | 37230 | 39301 |
| 30 - 34 | 37185 | 39254 |
| 35 - 39 | 36306 | 38325 |
| 40 - 44 | 34452 | 36369 |
| 45 - 49 | 30315 | 32000 |
| 50 - 54 | 28167 | 29733 |
| 55 - 59 | 22692 | 23953 |
| 60 ට වැඩි | 61873 | 65312 |

මූලාශ්‍රය - ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2011

## III කොටස - ඉන්දු ලංකා සිතියම

(05) (i) සපයා ඇති ඉන්දු ලංකා කාලගුණික සිතියමෙහි නිවැරදි වර්ණ සංකේත අක්ෂර යොදා ගනිමින් අංක 04 වගුවෙහි දැක්වෙන කාලගුණික දත්ත නිරූපණය කරන්න.

(ලකුණු 10)

(ii) මිලිබාර් දෙකක (02) අන්තරය ඇතිව සමපීඩන රේඛා නිර්මාණය කරන්න.

(ලකුණු 07)

(iii) ඉන්දු ලංකා කාලගුණික ප්‍රදේශයේ කාලගුණික පද්ධතිය කුමක්දැයි හඳුනාගෙන පවතින තත්ත්වය විස්තර කරන්න.

(ලකුණු 08)

(06) පහත සඳහන් මාතෘකා පිළිබඳව කෙටි සටහන් සපයන්න.

(i) කාලගුණය හා දේශගුණය

(ලකුණු 05)

(ii) නිවර්තන අවපාත හා නැගෙනහිර රැළි පීඩන

(ලකුණු 05)

(iii) සුළං ප්‍රවේගය හා බෝෆට් පරිමාව

(ලකුණු 05)

(iv) පහළ සහ ඉහළ වළාකුළු

(ලකුණු 05)

(v) කැටි වැහි හා කිණිහිරාකාර වැහි


(ලකුණු 05)

*****************************************

අංක 4 වගුව

ඉන්දු ලංකා ප්‍රදේශයේ සංක්ෂිප්ත කාලගුණය

| මධ්‍යස්ථාන අංකය | TT සෙ. | ppp මි.බා. | pp මි.බා. | N 0-8 | වලාකළු | | ch | dd සුළං | ff බොෆට් පරිමාව | කාලගුණය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | cl | cm | | | | වර්තමාන | අතීත |
| 003 | 28 | 002 | 2 | 1 | - | As | cl | NNE | 2 | - | - |
| 109 | 27 | 003 | 4 | 1 | - | - | cl | NE | 2 | - | - |
| 128 | 27 | 003 | 2 | 2 | cb | - | cl | SW | 2 | - | - |
| 149 | 29 | 002 | -1 | 3 | - | - | cl | SSW | 2 | මදකඩ වැස්ස | - |
| 194 | 28 | 998 | -3 | 6 | cu | As | - | SSW | 4 | වැස්ස | පොද වැස්ස |
| 237 | 26 | 999 | -2 | 6 | cb | - | - | SW | 4 | වැස්ස | පොද වැස්ස |
| 279 | 27 | 001 | -1 | 7 | cu | - | - | E | 3 | වැස්ස | - |
| 284 | 27 | 990 | -8 | 8 | cu | - | - | SSW | 12 | තද අවිච්න්න වැස්ස | තද අවිච්න්න වැස්ස |
| 295 | 28 | 000 | -4 | 7 | cu | As | - | SW | 10 | තද වැස්ස | තද වැස්ස |
| 333 | 27 | 001 | -2 | 4 | cb | As | cl | NNE | 6 | වැස්ස | වැස්ස |
| 344 | 26 | 000 | -2 | 3 | cu | - | - | NE | 4 | වැස්ස | - |
| 369 | 28 | 002 | 2 | 2 | cb | As | cl | SW | 2 | පොද වැස්ස | - |
| 371 | 28 | 001 | 3 | 3 | cb | - | cl | SSW | 3 | වැස්ස | - |
| 395 | 29 | 003 | 2 | 2 | cb | As | cl | ENE | 3 | - | - |
| 418 | 30 | 002 | 3 | 2 | cu | As | cl | NE | 2 | වැස්ස | - |
| 466 | 29 | 001 | 1 | 3 | - | As | cl | NW | 2 | - | - |
| 647 | 29 | 000 | 2 | 2 | - | As | cl | NNE | 1 | වැස්ස | - |
| 798 | 30 | 003 | 3 | 1 | - | - | cl | SSW | 2 | - | - |
| 867 | 27 | 003 | 3 | 1 | - | - | cl | SW | 1 | - | - |
| 971 | 27 | 003 | 2 | 2 | - | - | - | ENE | 1 | - | - |


India Sri Lanka Region Synoptic Weather Chart
Scale 1:15000,000
182
339
311
647
798
807
867
977
262
014
003
149
128
194
237
109
279
284
295
333
344
371
418
369
466
395
350
70
75
80
85
90
95
30
25
20
15
10
5
0